# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 1 දරන ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජනවාරි මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජනවාරි මස 23 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 7.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 1 දරන ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජනවාරි මස 22 වන දින]

එල්. ඩී.— ඕ. අයි.එන්.සී. 4/2007.

**ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති වලට අනුව එකී සංගමය හා සම්බන්ධ අරමුණු සහ කාරණා ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවා ඇත්තේ යම් අරමුණු හා කාර්ය සඳහා ද එම අරමුණු සහ කාර්යවලින් යම් අරමුණු සහ කාර්ය කීපයක් මේ දක්වා සාර්ථක ලෙස ඉටුකර ඇති හෙයින් ද, එම සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති නිසා ද එකී සංගමය සංස්ථාගත කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 1 දරන ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

**2.** (මෙහි මින් මතු "මධ්‍යස්ථානය "යනුවෙන් හඳුන්වනු ලබන) "ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ" දැනට සාමාජිකත්වය දරන තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය" යන නාමය සහ අභිධානය යටතේ වූ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද ඊට එරෙහිව ද සියලු අධිකරණවල නඩු පැවරීම හා පවරනු ලැබීමට ද පොදු මුද්‍රාව පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ බලය සහ අධිකාරිය ද තිබිය යුතු ය. ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

2-PL 003181 -2,700 (2008/08)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවා ඇත්තේ යම් පොදු පරමාර්ථ සඳහා ද එකී පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ලෝක බෞද්ධ මහා සම්මේලනය තුල ශ්‍රී ලංකාව නියෝජනය කිරීම ;

(ආ) බෞද්ධ ප්‍රතිපත්ති අනුව ක්‍රියා කිරීමට සාමාජිකයන් උනන්දු කරවීම ;

(ඇ) කලාපය තුළ සහ ලෝකය පුරා බෞද්ධාගමිකයන් අතර සමගිය වර්ධනය කිරීම;

(ඈ) කලාපය තුළ මෙන්ම ලෝකයේ වෙනත් ප්‍රදේශවල වෙසෙන බෞද්ධයන් අතර බුද්ධ ශාසනය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) බෞද්ධයන්ට, විශේෂයෙන්ම බෞද්ධ කාන්තාවන්ට බෞද්ධ දර්ශනය සහ බෞද්ධ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා සංවිධානය වීමට උනන්දු කරවීම සහ ඒ සඳහා ඔවුන්ට සහාය වීම;

(ඊ) බෞද්ධාගමික කටයුතු පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ බෞද්ධාගම හා සම්බන්ධ ප්‍රකාශන පළකිරීම;

(උ) බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආගමික අධ්‍යාපන කටයුතු නගා සිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ;

(ඌ) බෞද්ධයන් සඳහා සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපන සහ පුනරුත්ථාපන වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(එ) බෞද්ධයන් අතර සාමය, එකමුතු බව සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඒ) බෞද්ධයන්ගේ යහපත සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ලෝක බෞද්ධ මහා සම්මේලනයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඹ) සංස්ථාවේ අරමුණු නගාසිටුවීමේ අරමුණින් බෞද්ධයන් සඳහා දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, ප්‍රදර්ශන සහ වෙනත් සුදුසු වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම;

(ඕ) ලෝක බෞද්ධ මහා සම්මේලනයේ කලාපීය මධ්‍යස්ථානවල නියෝජිතයන් ඇතුළු ශ්‍රී ලංකාවට පැමිණෙන බෞද්ධාගමික අමුත්තන්ට අවශ්‍ය සහනයන් සහ පහසුකම් සැපයීම; සහ

(ක) සංගමයේ අරමුණුවලට සමාන අරමුණු ඇති වෙනත් ආයතන සහ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතුවල කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ විධිවිධානවලට යටත් ව (මෙහි මින් මතු “විධායක කමිටුව” යනුවෙන් හඳුන්වනු ලබන) 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලසා ඇති ආකාරයට තෝරාගනු ලබන නිලධාරි මඩුල්ලකින් සහ කමිටු සාමාජිකයන් ගණනකින් යුක්ත වූ විධායක සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ විධායක කමිටුවේ ප්‍රථම සාමාජිකයන් මේ පනත ආරම්භ වන දිනයට ඉක්බිතිව වූ දිනයේ දී මධ්‍යස්ථානයේ විධායක කමිටුවේ ධුරය දරන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, සංස්ථාවට ස්වකීය අරමුණු ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍යවන සේ කැමැත්ත දක්වන සියලු ක්‍රියා සහ කාරණා කිරීම, ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා බලය තිබිය යුතු අතර, පහත සඳහන් කරුණු ද ඊට ඇතුළත් විය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ වෙනත් ආකාරයකින් ලබාගැනීම;

(ආ) අරමුදල් ඇති කිරීම සහ මුදලින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රදාන , ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ඈ) භාණ්ඩාගාරික බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාරගැනීම, ඒ සඳහා වට්ටම් දීම, පිටසන් කිරීම, හුවමාරු කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ ඕනෑම බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ ගිණුම් වසා දැමීම;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන්නා වූ අරමුදල් විධායක කමිටුව තීරණය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම මෙන්ම ඔවුන්ට සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි තැනැත්තන් පුහුණු කිරීම ;

(උ) සංස්ථාවේ කාර්ය යථා පරිදි සහ කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු දේ ඉටු කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින හා ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් පහත සඳහන් කරුණු අතරින් යම් කරුණක් හෝ කරුණු කීපයක් සඳහා මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් බඳවා ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ සේවයෙන් ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) විධායක කමිටුවේ නිලධාරි මණ්ඩලය තෝරා ගැනීම, හෝ නිලධාරි මඩුල්ලේ ධුර හිස් වීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුනට අදාල නියම සහ කොන්දේසි ;

(ඇ) විධායක සභාවේ, සංස්ථාවේ හෝ එහි අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එහි පුරප්පාඩු පිරවීම, එකී රැස්වීම්වල දැන්වීම් සහ න්‍යායපත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ එහි කටයුතු කරගෙන යාම, ගණපූරණය සහ කටයුතු පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඉ) විධායක කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙස, එවැනි රැස්වීමක දී එවැනි ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සියලු කල්හි දී මේ වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාව වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, වාරික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ බැරට විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබිය හැකි එක් බැංකුවක, බැංකු කිහිපයක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍යවන සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට කටයුතු සළස්වනු ලැබිය යුතු ය.

(3) විධායක කමිටුව විසින් පත්කරගනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ එකී ආයතනය මගින් ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරනු ලබන තැනැත්තකු ; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

මධ්‍යස්ථානයට අයවිය යුතු සහ මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු ණය මුදල්.

**9.** මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම දිනයේ දී මධ්‍යස්ථානයේ පැවති සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට මධ්‍යස්ථානය වෙත ගෙවිය යුතු සියලු ණය, වාරික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා සහිත වීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු විසින්, සංස්ථාවේ ණය සහ වගකීම්, ඉටුකිරීමේ කාර්යයක් සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සංස්ථාව වෙත කලින් කල ගෙවිය යුතු සාමාජික ගාස්තු මුදල ඉක්මවනු ලබන්නා වූ යම් දායක මුදලක් ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබුවා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාවේ විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවක් මගින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය

අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.